# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1606/32 - 2009 ජුනි 19 වැනි සිකුරාදා - 2009.06.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2006 අංක 10 දරන දේශීය ආදායම් පනත**

4 වැනි වගන්තිය යටතේ දැන්වීම

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් සහම්පති අංගම්මන වන මම, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 4 වැනි වගන්තියේ (2) උප වගන්තියේ අතුරු විධානයේ විධි විධානය යටතේ 2009 අප්‍රේල් මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙහි උපලේඛනයේ දක්වා ඇති කිසියම් ප්‍රතිලාභයක වටිනාකම වශයෙන් යොදා ගත යුතු අගය, එකී වගන්තියේ කාර්යයන් සඳහා දැනටමත් තීරණය කර ඇති කිසියම් අගයක් නොතකා, මෙයින් නිශ්චය කරමි.

සහම්පති අංගම්මන,
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්.

2009 ජුනි මස 16 වැනි දින,
කොළඹ,
දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දී ය.

06-359

### උපලේඛනය

1. යම් සේවා යෝජකයෙකුගේ සේවා නියුක්තිකයෙකුට හෝ එකී සේවා නියුක්තිකයා වෙනුවෙන් නම් කරන ලද තැනැත්තෙකුට, එකී සේවා යෝජකයා විසින් හෝ සේවා යෝජකයා වෙනුවෙන් යම් කොටසක් වෙන් කිරීම මගින් හෝ යම් කොටසක් අත්පත් කරගැනීම සඳහා මනාපය ලබාදීම මගින්, එම සේවා යෝජකයාගේ සේවා නියුක්තිකයාට උපචිත වන යම් ප්‍රතිලාභයක "වටිනාකම" යනුවෙන් අදහස් කරනුයේ අවස්ථාවෝචිත පරිදි එවැනි කොටසක් වෙන් කිරීමේ අවස්ථාවේ දී හෝ කොටස පැවරීම කරන අවස්ථාවේ දී හෝ මනාපය අලෙවිකිරීමක් කරන අවස්ථාවේ දී හෝ අවස්ථාවෝචිත පරිදි, එකී වෙන් කිරීම හෝ ප්‍රදානය සඳහා අයකරනු ලබන මුදල ඉක්මවා එකී කොටසෙහි වෙළඳපල වටිනාකමෙහි අතිරික්තයක් පවතී නම් එම අතිරික්තයයි.

2. 4 (1) ඈ වගන්තියෙහි කාර්යය සඳහා සේවා යෝජකයා විසින් සපයා දෙන ලද යම් වාසස්ථානයක කුලී වටිනාකම —

(i) වරිපනම් බදු පනවා නොමැති ප්‍රදේශයක පිහිටා ඇති වාසස්ථානයක් සඳහා වන විට, දළ පාරිශ්‍රමිකයෙන් 10% හෝ මසකට රු. 3,000 යන දෙකින් අඩු ප්‍රමාණය ;

(ii) වතු බංගලා සම්බන්ධයෙන් වන විට, දළ පාරිශ්‍රමිකයෙන් 5% හෝ මසකට රු. 2,000 යන දෙකින් අඩු ප්‍රමාණය.

වාසස්ථාන සඳහා ගෘහභාණ්ඩ සපයා දී ඇති අවස්ථාවක දළ පාරිශ්‍රමිකයෙන් 2.5% හෝ මසකට රු. 1,500 ක් යන දෙකින් අඩු අගය ඉහතින් නිර්ණය කරන ලද අගයට එකතු විය යුතු ය.

1A - G 011299 — 2,255 (2009/06)

සේවා නියුක්තිකයා පදිංචි වී සිටින නිවසක් හෝ බද්ධ නිවසක් සම්බන්ධ යම් වියදමක් සේවා යෝජකයා විසින් ප්‍රතිපූරණය කරනු ලබන්නේ නම් එම ප්‍රතිලාභයෙහි වටිනාකම වනුයේ සේවා යෝජකයා විසින් ප්‍රතිපූරණය කරන ලද සත්‍ය වියදම විය යුතු ය.

3. *ප්‍රවාහන පහසුකම් :*

(අ) සේවා යෝජකයා විසින් සපයනු ලබන එන්ජින් ධාරිතාව 1500 cc හෝ ඊට වැඩි යම් මෝටර් වාහනයක් පුද්ගලිකව පාවිච්චි කිරීමේ ප්‍රතිලාභයේ අගය මසකට රුපියල් පහළොස් දහසක් සේ සැලකිය යුතු ය.

සේවා යෝජකයා විසින් සපයනු ලබන එන්ජින් ධාරිතාව 1500 cc ට අඩු යම් මෝටර් වාහනයක් පුද්ගලිකව පාවිච්චි කිරීමේ ප්‍රතිලාභයේ අගය මසකට රුපියල් හත් දහස් පන්සියයක් සේ සැලකිය යුතු ය.

සේවා යෝජකයා විසින් සපයනු ලබන මෝටර් සයිකලයක් පුද්ගලිකව පාවිච්චි කරයි නම් එකී ප්‍රතිලාභයේ අගය මසකට රුපියල් දෙදහසක් සේ සැලකිය යුතු ය.

(ආ) ඉන්ධන වියදම සේවා යෝජකයා විසින් දරනු ලබන අවස්ථාවක, සේවා නියුක්තිකයාට අයත් යම් මෝටර් රථයක්, පුද්ගලික ව පාවිච්චි කිරීමේ ප්‍රතිලාභයේ අගය එන්ජින් ධාරිතාව නොතකා මසකට රුපියල් පන්දහසක් සේ සැලකිය යුතු ය.

ඉන්ධන වියදම් සේවා යෝජකයා විසින් දරනු ලබන සේවා නියුක්තිකයාට අයත් යම් මෝටර් බයිසිකලයක් පුද්ගලික ව පාවිච්චි කිරීමේ ප්‍රතිලාභයේ අගය මසකට රුපියල් හත්සිය පනහක් සේ සැලකිය යුතු ය.

(ඇ) සේවා යෝජකයා විසින් නිවැරදි ගමනාගමන සටහන් පවත්වාගෙන යනු ලබන යම් වාහනයක් සේවා නියුක්තිකයා පුද්ගලිකව පාවිච්චි කිරීමේ ප්‍රතිලාභයේ එන්ජින් ධාරිතාවය නොතකා අගය කිලෝමීටරයකට රුපියල් පහලොවක් සේ සැලකිය යුතු ය.

සේවා යෝජකයා විසින් නිවැරදි ගමනා ගමන සටහන් පවත්වාගෙන යනු ලබන, යම් මෝටර් බයිසිකලයක් පුද්ගලික ව පාවිච්චි කිරීමේ ප්‍රතිලාභයේ අගය කිලෝමීටරයකට රුපියල් තුනක් සේ සැලකිය යුතු ය.

(ඈ) සේවා නියුක්තිකයාට අයත් යම් මෝටර් රථයක් හෝ මෝටර් බයිසිකලයක් නඩත්තු කිරීම වෙනුවෙන් යම් සත්‍ය වියදමක් සේවා යෝජකයා විසින් ප්‍රතිපූරණය කරන විටක දී අදාල ප්‍රතිලාභයේ අගය සේවා යෝජකයා විසින් ප්‍රතිපූරණය කරන ලද සත්‍ය වියදම් විය යුතු ය.

4. *අනිකුත් ප්‍රතිලාභ:*

| ප්‍රතිලාභයෙහි ස්වභාවය | ප්‍රතිලාභවල වටිනාකම් |
|---|---|
| 1. විදේශිකයන් සඳහා හෝටල් පහසුකම් සැපයීම | ශ්‍රී ලංකාවට පැමිණි දින සිට පූර්ව මාස 3, සඳහා වියදමෙන් 25% සහ ඉන්පසු 100% |
| 2. මෙහෙකරුවන් යනාදිය සැපයීම | පිරිවැයෙන් 100% |
| 3. වියදම් සහ ගෑස් යනාදිය සැපයීම | පිරිවැයෙන් 100% |
| 4. වෛද්‍ය ප්‍රතිලාභ සැපයීම: | |
| (i) රක්ෂණ වාරිකයෙහි සමස්ථ දායකත්වය සේවා යෝජකයා විසින් දරන විට | සේවා නියුක්තිකයාට ප්‍රතිපූරණය කරනු ලබන වෛද්‍ය බිල්පත් 100% මුදල (ප්‍රතිපූරණය කරන අවස්ථාවේ දී ) |
| (ii) එක් එක් සේවා නියුක්තිකයා සම්බන්ධයෙන් වෙන් වෙන් වශයෙන් සේවා යෝජකයා විසින් දායකත්වය ලබා දෙන විට | එම දායකත්ව මුදලෙන් 100% |
| (iii) සේවා යෝජකයා විසින් බිල්පත් ගෙවනු ලබන විට | එම වෛද්‍ය බිල්පත්වලින් 100% |
| 5. නොමිලේ ලබා දෙන ආහාර | පිරිවැයෙන් 100% |
| 6. රක්ෂණ වාරිකය ගෙවීම | පිරිවැයෙන් 100% |
| 7. දුරකථන බිල්පත් සහ වාර්ෂික ගාස්තු ගෙවීම | පිරිවැයෙන් 50% |
| 8. ගුවන් ටිකට්පත් (ගුවන් ප්‍රවාහන සමාගම්වල සේවා නියුක්තිකයන් වෙත ලබාදෙන ටිකට්පත් හැර) | පිරිවැයෙන් 100% |
| 9. බදු ගෙවීම | ගෙවන ලද බදු ප්‍රමාණය (අංක 06 දරන බදු චක්‍රය බලන්න) |

07-161

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.